ඔබම දැනුවත් කිරීම අපගේ යුතුකමකි
+61 3 9792 9977 info@warnalegal.com



**දැන් ඕස්ට්‍රේලියා රජය විසින් (Northern Territory New Migration Scheme ) හදුන්වා දී ඇත. එහිදී අදාල වෘත්තිකයන් සඳහා සහන ලෙෂ අවම ඉංග්‍රීසි දැනුම සහ අවම නිපුනතා සලකා බැලේ. මෙය ඔබට අනගි අවස්ථාවක් වන අතර, ඒ සඳහා අයදුම් කිරීමට කටයුතු කරන්න.**

1. **මාගේ මිතුරෙකු වන ඕස්ට්‍රේලියානු ජාතිකයෙකු ඕස්ට්‍රේලියානු සංචාරයක් සඳහා මා හට ආරාධනා කරයි. ඔහු මා හට ඒ සඳහා අනුග්‍රහය දක්වන බවද (sponsorship) කියා සිටියි. මේ හේතුවෙන් මා හට අනිවාර්යයෙන් සංචාරක වීසා ලැබේද?**

   ප්‍රසාද් - ශ්‍රී ලංකාව

   සංචාරක වීසා (Tourist VISA) ප්‍රදානය කරීම සඳහා ඕස්ට්‍රේලියානු රජය මිනුම් දඬු කීපයක් භාවිතා කරයි. ඔබ එම මිනුම් සම්පූර්ණ කරන්නේ නම් ඔබට වීසා ලැබීමේ වැඩි සම්භාවිතාවයක් ඇත. ඔහුට ඔබගේ සංචාරය වෙනුවෙන් ඔහුගේ ලෙබණ, විස්තර සහ අදාල ලියුම් ලබාදිය හැකිය. නමුත් එපමනින්ම වීසා ලැබේ යැයි කිව නොහැක. ප්‍රධන කාරණය වන්නෙ ඔබ අදාල මිනුම් දඬු සැපිරීමයි.

2. **මම ඕස්ට්‍රේලියාවේ ස්ථිර පදිංචි කරුවෙකු වන අතර, මෑතකදී ශ්‍රී ලංකාවට පැමිනියෙමි. දැනට මාස 3 ක් ශ්‍රී ලංකාවේ නැවතී සිටින අතර, මා නැවත යාමට සූදානම් වන අවස්ථාවේ දැන ගැනීමට ලැබුනේ මාගේ ස්ථිර .පදිංචි කාර වීසා (Permanent Residency Visa) කල් ඉකුත් වී ඇති බවයි. දැන් මා කුමක් කල යුතුද?**

   නුගවෙල - ශ්‍රී ලංකාව

   ඔබට ස්ථිර පදිංචිකාර වීසාව ඕස්ට්‍රේලියානු රජයෙන් ලබා දෙන්නේ අවුරුදු 5 ක් දක්වා පමනි. ඔබ රටින් පිටතට යන්නේ නම් සහ එහිදී වසර 5 ක කාලය අවසන් වන්නේ නම්, ඔබ පදිංචි කරු නැවත පැමිනීමේ වීසාව (Resident Return Visa) අයදුම් කල යුතුය. හැකි විගස එය අයදුම් කර ලබා ගන්න. මෙම වීසාව නොමැතිව ඔබට නැවත ඕස්ට්‍රේලියාවට ඇතුල් විය නොහැක.

3. **මා කාර්මිකයකු ලෙස සේවා ස්ථානයක වැඩ කලෙමි. මා හට වැටුප් නොගෙවීම නිසා මා දැන් එම ස්ථානයෙන් ඉවත්ව සිටිමි. මා හට දැන් මහේස්ත්‍රාත් උසාවියෙන් (Magistrate Court) කඩදාසි එවා ඇති අතර, ඒ අනුව මා වැඩ කල ආයතනය මට නොදන්වා සහ මාගේ කැමැත්තකින් තොරව ඔවුන්ගේ ණය සඳහා මා ඇප කාරයෙකු ලෙස පත්කර එහි මාගේ අත්සනද යොදා ඇත. ණය නොගෙවීම මත මා හට මෙම උසාවි කඩදාසි නිකුත් කර ඇත. අහිංසක මා කුමක් කල යුතුද?**

   කමලනාදන් - බන්ධූරා (Bandoora)

   ඔබ මෙම ගනුදෙනු සම්බනයට කිසිදු දැනුවත් කමක් නොමැති බවත්, ඔබගේ අත්සන වංචා කර ඇති බවත් පිළිතුරු පත්‍රයේ යොදා උසාවියට ගොනු කරන්න. ඔබ එම ආයතනයේ සේවකයකු ලෙස පමනක් වැඩ කටයුතු කල බවත්, දැන් එහි සේවයේ නොමැති බවත්, ආයතනය වංචනිකව කටයුතු කර ඇති බවත් පහදා දෙන්න.

4. **මා හට අවුරුදු 3 ක තාවකාලික රැකවරන වීසා (Temporary Protection Visa) ලැබී ඇත. මෙම කාලය දීර්ග කර ගත නොහැකිද?**

   සම්පත් - Perth

   නව නීතිය යටතේ ඔබට රැකවරන වීසා ලැබී ඇත්නම් එය අළුත් කිරීම සඳහා අවස්ථාවක් ඔබට ලබා දෙයි. එය මෙම පවතින වීසාව ඉකුත් වීමට ආසන්න කාලයේදී ඔබට ලිපි මඟින් ඕස්ට්‍රේලියානු ආගමන විගමන දෙපාර්තමේන්තුව දන්වා සිටී. ඔබගේ වර්ථමාන ලිපිනය දෙපාර්තමේන්තුව සතුව පවතීදැයි සැක හැර දැන ගන්න. ඔබට වීසා අළුත් කිරීම සඳහා අයදුම් ලැබුනු කල අවුරුදු 5 ක් දක්වා ඇති Safe Heaven Enterprise Visa අයදුම් කල හැකිය.

5. **මා ගිණුම්කරුවෙකු (Accounter) වශයෙන් ඕස්ට්‍රේලියාවේ අධ්‍යාපනය ලද අතර , ඒ සඳහා පුහුණුවද ලදිමි. නමුත් ස්ථිර පදිංචිය සඳහා අයදුම්පත් යොමු කිරීමේදී ඉංග්‍රීසි දැනුම ඉතා ඉහලින් සලකා බලන බැවින් මා හට එය සම්පූර්න කර ගත නොහැක. ඕස්ට්‍රේලියාවේ ස්තීර පදිංචිය මාගේ සිහිනයක් බැවින් මා හට විකල්පයක් නැතිද?**

   සුමුදු - Sydney

   දැන් ඕස්ට්‍රේලියා රජය විසින් Nothern Territory New Migration Scheme හදුන්වා දී ඇත. එහිදී අදාල වෘත්තිකයන් සඳහා සහන ලෙෂ අවම ඉංග්‍රීසි දැනුම සහ අවම නිපුනතා සලකා බැලේ. මෙය ඔබට අනගි අවස්ථාවක් වන අතර, ඒ සඳහා අයදුම් කිරීමට කටයුතු කරන්න.

WARNALEGAL
Justice for all
නීති උපකාර | சட்ட சேவைகள் | Legal Services
Need Legal Help? Call us Now

- FAMILY LAW
- AUSTRALIAN LEGAL ADVICE
- MIGRATION LAW
- SRI LANKAN LEGAL ADVICE
- CONVEYANCING
- COMMERCIAL & BUSINESS LAW
- LITIGATION
- POWERS OF ATTORNEY & WILLS
- ENGLISH/SINHALESE TRANSLATION & INTERPRETING SERVICE
- SRI LANKAN DEEDS AND COMPANY REGISTRATION SERVICE



Madhu Warnakulasuriya LL.B
Solicitor and Barrister
Registered Migration Agent
(MARN 1068979)
Attorney at Law in Sri Lanka

03 9792 9977

Australia:
1/44 King Street
Dandenong VIC 3175
0432 480 133
+61 3 9792 9977
+61 3 9701 3718
info@warnalegal.com
warnalegal1
www.warnalegal.com

Sri Lanka:
01 Angampitiya Waikkala Sri Lanka
Hotline – 0776 120 008
031 22 72223 031 22 72223
warnalegal2@gmail.com
warnalegal2